# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,125 — 1960 මැයි 6 වැනි සිකුරාද — 6.5.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටුඅංක යොද ඇත)


| | | | පිට |
|---|---|---|---|
| **ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :—** | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 205 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | | ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | ... | ... | 211 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1954 අංක 39 දරණ (සංශෝධිත) පනතින් සංශෝධනය කළ පරිදි, 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**5වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ (සංශෝධිත) පනතින් සංශෝධනය කළ පරිදි, 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

(1) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළයේ (මැද පත්තුව) පට්ටලගෙදර පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 02 ක් පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට : අඩිපාර; දකුණට : කේ. ඒ. කුමාරගේ හිමිකම් කියන බටදොඹගහ වත්ත නමැති ඉඩම; බටහිරට : එම ඉඩමේම කොටසක්.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළයේ (මැද පත්තුව) පට්ටලගෙදර පිහිටි ගොරකගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 01.5ක් පමණ ඇති බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට : එම ඉඩමේම කොටසක්; දකුණට : කේ. ඒ. ඒබ්‍රහම් සිංඤෝ හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම; බටහිරට : අඩි පාර.

(3) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළයේ (මැද පත්තුව) පට්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 02.0 ක් පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : පී. ජේ. ප්‍රනාන්දු මහත්මිය හිමිකම් කියන ගොරකගහ වත්ත නමැති ඉඩම; නැගෙනහිරට : එම ඉඩමේම කොටසක්; දකුණට : ජී. ඩී. තෙපානිස් ප්‍රනාන්දු හිමිකම් කියන කහටගහ වත්ත නමැති ඉඩම; බටහිරට : අඩි පාර.

(4) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළයේ (මැද පත්තුවේ) පට්ටලගෙදර පිහිටි බටදොඹගහ වත්ත නමැති ඉඩමෙන් පර්චස් 01 ක් පමණ බිම් කොටසක්, ඊට මායිම් .—

උතුරට : පී. ජේ. ප්‍රනාන්දු මහත්මිය විසින් හිමිකම් කියන ගොරකගහවත්ත නමැති ඉඩම; නැගෙනහිරට : අඩි පාර; දකුණට : කේ. ඒ. කෙච්චිහාමි හිමිකම් කියන බටදොඹගහවත්ත නමැති ඉඩම; බටහිරට : එම ඉඩමේම කොටසක්.

(5) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළයේ (මැද පත්තුව) පට්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 01 ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : කේ. ඒ. ඒබ්‍රහම් සිංඤෝ හිමිකම් කියන කහටගහ වත්ත නමැති ඉඩම; නැගෙනහිරට : එම ඉඩමේම කොටසක්; දකුණට සහ බටහිරට : අඩිපාර.

(6) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැදපත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහ වත්ත නැමැති ඉඩමෙන් පර්චස් 02 ක් පමණ බිම් කොටසක්, ඊට මායිම් :—

උතුරට : කේ. ඒ. කේව්විහාමි අයිතිකම් කියන බටදොඹගහවත්ත නමැති ඉඩම (අත්පත්කර ගැනීමට යෝජනා කර ඇති) ; නැගෙනහිරට : අඩිපාර ; දකුණට : එම ඉඩමේම කොටසක් ; බටහිරට : ආර්. ජේ. පොන්සේකා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම

(7) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැදපත්තුව) පව්ටලගෙදර පිහිටි බටදොඹගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 03ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේම කොටසක් ; නැගෙණහිරට : කේ. ඒ. කුමාර ගේ හිමිකම් කියන බටදොඹගහවත්ත නමැති ඉඩම ; දකුණට : කේ. ඒ. ලීලාවතී සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම සහ අඩිපාර ; බටහිරට : මේරිනෝනා සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම.

(8) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි බටදොඹගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 03ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට, නැගෙණහිරට සහ දකුණට : එම ඉඩමේම කොටසක් ; බටහිරට : කේ. ඒ. මේරිනෝනා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම.

(9) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැදපත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 05 ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේම කොටසක් ; නගෙණහිරට : කෙව්විහාමි හිමිකම් කියන බටදොඹගහවත්ත නමැති ඉඩම ; දකුණට : ආර්. ජේ. පොන්සේකා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; බටහිරට : ජී. සී. ආර්. පොන්සේකා සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම.

(10) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 05.5ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : කේ. ඒ. මේරිනෝනා සහ තවත් අය හිමිකම් කියන කහට ගහවත්ත නමැති ඉඩම ; නැගෙණහිරට : කේ. ඒ. ලීලාවතී සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; දකුණට: ආර්. ඒ. ඩැනියෙල් සිංඤෝ හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම සහ එම ඉඩමේම කොටසක් ; බටහිරට : ජී. සී. ආර්. පොන්සේකා සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම.

(11) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 01.5ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට සහ නැගෙණහිරට : ආර්. ජේ. පොන්සේකා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; දකුණට : ආර්. ඒ. ඩැනියෙල් සිංඤො හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; බටහිරට : එම ඉඩමේම කොටසක්.

(12) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 02 ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : ජී. සී. ආර්. පොන්සේකා සහ තවත් අය හා ආර්. ජේ පොන්සේකා ට අයිති කහටගහවත්ත නමැති ඉඩම් ; නැගෙණ හිරට : කේ. ඒ. එලාරිස් පෙරේරා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; දකුණට : කේ. ඒ. මෙන්ඩිස් පෙරේරා සහ තවත් අය හිමිකම කියන කහටගහවත්ත නමැති ඉඩම ; බටහිරට : එම ඉඩමේම කොටසක්.

(13) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 04.5 ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : ආර්, ජේ. පොන්සේකා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; නැගෙණහිරට : එම ඉඩමේම කොටසක් ; දකුණට : කේ. ඒ. මෙන්ඩිස් පෙරේරා සහ තවත් අයට අයිති කහටගහ වත්ත නමැති ඉඩම ; බටහිරට : ආර්. ඒ. ඩැනියෙල් සිංඤෝ හිමිකම් කියන කහටගහ වත්ත නම [illegible] ඉඩම.

(14) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 07 ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : I. කේ. ඒ. එලාරිස් පෙරේරා සහ ආර්. ඒ. ඩැනියෙල් සිංඤෝ යන අය හිමිකම් කියන කහටගහ වත්ත නමැති ඉඩම ; II. එම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට : ඊ. ඒ. ජේපින් නෝනා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; දකුණට සහ බටහිරට : එම ඉඩමේම කොටසක්.

(15) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහවත්ත නමැති ඉඩමෙන් පර්චස් 06 ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : එම ඉඩමේම කොටසක් ; නැගෙණහිරට : අඩිපාර ; දකුණට: ඇම්. ජේ. පෙරේරා හිමිකම් කියන කහටගහ වත්ත නමැති ඉඩම ; බටහිරට : කේ. ඒ. මෙන්ඩිස් පෙරේරා සහ තවත් අය හිමිකම් කියන කහටගහ වත්ත නමැති ඉඩම.

(16) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහ වත්ත නමැති ඉඩමෙන් පර්චස් 05 ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : ඊ. ඒ. ජේපින් නෝනා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; නාගෙණහිරට : අඩිපාර ; දකුණට : එම ඉඩමේම කොටසක් ; බටහිරට : කේ. ඒ. මෙන්ඩිස් පෙරේරා සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම.

(17) කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑකෝරලයේ (මැද පත්තුව) පව්ටලගෙදර පිහිටි කහටගහ වත්ත නමැති ඉඩමෙන් පර්චස් 02.5ක පමණ බිම් කොටසක්. ඊට මායිම් :—

උතුරට : කේ. ඒ. සෙසිනෝනා හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; නැගෙණහිරට : කේ. සී. සෝමචන්ද්‍ර හිමිකම් කියන කහටගහවත්ත නමැති ඉඩම ; දකුණට : එම ඉඩමේම කොටසක් ; බටහිරට : අඩි පාර

සී. පී. ද සිල්වා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

අංකය : කො. ජේ57/58 ඇල් ජී 498/කිව්. ඒ427.
1959 නොවැම්බර් මස 11 වැනි දින.

---

අංකය ජේ 58/59 ඇන්. ඇස්. 372.

## 1954ජේ අංක 39 දරණ සංශොධිත ආඥපනතින් සංශොධනය කල පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥ පනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954ජේ අංක 39 දරණ සංශොධිත ආඥපනතින් සංශොධනය කල පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටලාගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑකෝරලේ නිව්වඹුවේ ගම්මුලාදැනි කොට්ඨාශයට අයත් නම්බඩලුව ගමේ පිහිටි දෙල්ගහ වත්ත යන ඉඩමෙන් අක්කර 5ක් පමණ ඇති කොටස් දෙකක්.

**මායිම්**

**(1) අක්කර $4\frac{1}{2}$ පමණ ඇති**

උතුරට : මෙම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට : ඒ. ඇල්. ඩී. පොඩිසිංඤෝ මයා සහ තවත් අය අයිතිකම් කියන මිරිස්වත්ත නැමැති ඉඩම සහ ඊ. සී. සෙනෙවිරත්න මයා අයිතිකම් කියනා කන්දහේන වත්ත ; දකුණට : ඊ. සී. සෙනෙවිරත්න මයා අයිතිකම් කියන කන්දහේන වත්ත සහ ආර්. ඒ. පොඩි අප්පුහාමි මයා අයිතිකම් කියන ඉඹුල්ගහහේන ඉඩම ; බස්නා හිරට : එච්. ඒ. ජේම්ස් සිංඤෝ මයා සහ තවත් අය අයිතිකම් කියන කදුරුගහවත්ත ඉඩම සහ කේ. ජේ. විජේසේකර මයා අයිතිකම් කියන දවටගහවත්ත ඉඩම

**(2) අක්කර $\frac{1}{2}$ පමණ ඇති**

උතුරට : කොළඹ මහනුවර පී. ඩබ්ලිව්. ඩී. පාර ; නැගෙනහිරට : මෙම ඉඩමේම කොටසක් ; දකුණට : මෙම ඉඩමේම කොටසක් (අත්කර ගැනීමට තිබෙන) ; බස්නාහිරට : මෙම ඉඩමේම කොටසක් සහ ඩබ්ලිව්. එලාරිස් මයා අයිතිකම් කියන කදුරුගහ වත්ත ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960 ක්වූ අප්‍රියෙල් මස 7 වැනි දින,
කොළඹදීය.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාල් ලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

(1) කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ කදුගොඩ ගම්මුලාදෑනි වසමේ කදුගොඩ යන ගමේ පිහිටි දෙහිගහවත්ත නමැති අක්කර 3/4ක පමණ විශාලකම් ඇති ඉඩම් කැබැල්ලට මායිම්:—

උතුරට: මාබුල, වග ඇල්. ඩී. ඒබ්‍රහම් අයිතිකම් කියන හික්ගහ වත්ත නමැති ඉඩම; නැගෙනහිරට: කොස්ගම-වැළිකන්න පී. ඩබ්ලිව්. ඩී. පාර; දකුණට: කදුගොඩ සිංහල මිශ්‍ර පාසැල් ඉඩම (රජය සතු); බස්නාහිරට: කදුගොඩ, වග ඩී. ඇස්. ගොඩමුනේ අයිතිකම් කියන කදුගොඩලන්ද නමැති ඉඩම (දැනට අත්පත් කර ගෙන යන).

(2) කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කදුගොඩ ගම්මුලාදෑනි වසමේ කදුගොඩ යන ගමේ පිහිටි කදුගොඩලන්ද නමැති ඉඩමෙන් අක්කර 3/4ක පමණ විශාලකම් ඇති ඉඩම් කොටසකට මායිම්:—

උතුරට: මාබුල, වග ඇල්. ඩී. ඒබ්‍රහම් අයිතිකම් කියන හික්ගහ වත්ත යන ඉඩම; නැගෙනහිරට: කදුගොඩ, වග ජී. ඒ. මර්තිනාහාමි අයිතිකම් කියන දෙහිගහවත්ත යන ඉඩම (දැනට අත්පත් කර ගෙන යන); දකුණට: කදුගොඩ සිංහල මිශ්‍ර පාසැල් ඉඩම (රජය සතු); බස්නාහිරට: එම ඉඩමේම ඉතිරි කොටස.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

අංකය: කිවි.බී. 380/ජේ 58/59 ඊ 533.

1960ක් වූ අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාල් ලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළයේ 'ඒ' කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ වසමේ අංගල්පිටිය යන ගමේ පිහිටි වෙරල්ලගහවත්ත යන ඉඩමෙන් අක්කර 1, රූඩ් 3, පර්චස් 0ක පමණ විශාලකම් ඇති ඉඩම් කොටසකට මායිම්:—

උතුරට: ගම්සභා අඩි පාර; නැගෙනහිරට: දොන් ජෝන් ඉසිදෝර් වණසිංහ අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්; දකුණට: එම ඉඩමේම ඉතිරි කොටස සහ ඩී. ඇල්. සමරකෝන් අයිතිකම් කියන එම ඉඩමේම කොටසක්; බස්නාහිරට: පමුණුගම-පිටිපන පී.ඩබ්ලිව්. ඩී. පාර.

එම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

අංකය: කිවි.බී. 378/ජේ 58/59 ඇල්.ජී. 542.

1960ක් වූ අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) අඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍ය‍යක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල් ලගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ආදායම් නිලධාරි කොට්ඨාශයේ දේදුනුපිටිය ගම්මුලාදෑනි කොට්ඨාශයේ ගොඩතලේ ගමේ පිහිටි උඩත්තාදෙනිය නොහොත් උඩත්තාදෙනියේ හේන නමැති, අවසාන ගම් සිතියම් අංක 177 හි කැබලි අංක 335, 354, 405, 406 සහ 408 යනුවෙන් විස්තර කරන ලද ප්‍රමාණයෙන් අ. 6, රූ. 0, ප. 15 ක් පමණ ඇති පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කැබලි පහ.

උතුරට: උඩත්තාදෙනියේ වත්ත, උඩත්තාදෙනියේ කුඹුර, කෙහෙල්වත්තේහේන සහ උඩත්තාඳෙනියේ හේන "අවසාන ගම් සිතියම් අංක 177 තේ බිම් කැබලි අංක 332, 334, 338, 323, 322, 341 සහ 344"; නැගෙනහිරට: බෝගහහේන සහ බෝගහ වත්ත "අ. ග. සි. 177තේ කැබලි අංක 353"; දකුණට: පහලගම "අ. ග. සි. අංක 185"; බස්නාහිරට: බන්ඩාරවත්ත, මුහන් ගම්මන කුඹුර සහ මුහන්ගම්මන වත්ත "අ. ග. සි. අංක 177තේ කැබලි අංක 283".

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය: ජේ. 57/58 ඇල් 474 (වී. ඊ.),

ඇල්. ඩී/ඇිජ්. 6.

1960 මාර්තු මස 28 දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) අඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍ය‍යක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් සහ ඉඩම් අමාත්‍ය මොහොට්ටාල්ලගේ ඩිංගිරි බණ්ඩා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත්පත්තුවේ හල්මිඹේ පලාතේ හල්මිඹේ නමැති ගමේ පිහිටි මයිලගහ වත්ත නමැති ඉඩමෙන් අ. 0, රූ. 1, ප. 21.5 ක් පමණ ඇති පහත සඳහන් මායිම් තුල පිහිටි බිම් කොටස:—

උතුරට සහ දකුණට: රජය සතු ඉඩම; නැගෙනහිරට සහ බස්නාහිරට: එකී ඉඩමේ ඉතිරි කොටස.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකම් සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය 3/61/16—ජේ. 55 ඇල් 563.

1960 අප්‍රේල් මස 7 දින,
කොළඹදීය.

---

ඇල්. ඇල්/ඒ. 6458.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ මොහොට්ටාල් ලගේ ඩිංගිරි බණ්ඩා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටි කෝරළේ කැඳන්ගමුව පහලගම ගම්මුලාදෑනි කොට්ඨාශයේ යකුදාගොඩ ගම්මත්ඩියෙ (කොටසක)

සහ තිබ්බොටුවාව නමැති ගමේ පිහිටි කොරටුවෙලියද්ද, මහකුඹුර සහ තුඹපිටියකුඹුර, අස්මලේකුඹුර, දොඩන්ගහයටලියද්ද සහ තුඹපිටිමුල්ල නමැති බෙදා වෙන්කළ ඉඩම් කොටස් පහෙන් අ. 0, රූ. 2, ප. 37.56ක ප්‍රමාණයක්, මායිම් පහත දැක්වේ:—

(1) **කොරටුවලියද්ද** (අංක 673 දරණ ගම් සිතියමේ ලොට් 144 කොටසක්) ප. 23.63 ප්‍රමාණයක්.

උතුරට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතුරු කොටස්; නැගෙනහිරට: බිසෝදොල; දකුණට: එම ඉඩමේ ඉතුරු කොටස සහ බිසෝදොල.

(2) **මහකුඹුර සහ තුඹපිටියකුඹුර** (අංක 673 දරණ ගම් සිතියමේ ලොට් 69 කොටසක්) අ. 0, රූ. 1, ප. 0 ප්‍රමාණයක්.

උතුරට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතුරු කොටස්; නැගෙනහිරට සහ දකුණට: බිසෝදොල.

(3) **අස්මලේකුඹුර** (අංක 675 දරණ ගම් සිතියමේ ලොට් 27 කොටසක්) ප. 26.06 ප්‍රමාණයක්.

උතුරට: බිසෝදොල සහ දන්ගහයටලියද්ද නමැති ඉඩම; නැගෙනහිරට සහ දකුණට: එම ඉඩමේ ඉතුරු කොටස්; බස්නාහිරට: බිසෝදොල.

(4) **දොඩන්ගහයටලියද්ද** (අංක 675 දරණ ගම් සිතියමේ ලොට් 26 කොටසක්) ප. 06.66ක ප්‍රමාණයක්.

උතුරට: තුඹපිටිමුල්ල නමැති ඉඩම සහ බිසෝදොල; නැගෙනහිරට: එම ඉඩමේ ඉතුරු කොටස; දකුණට: අස්මලේකුඹුර නමැති ඉඩම; බස්නාහිරට: බිසෝදොල.

(5) **තුඹපිටිමුල්ල** (අංක 675 දරණ ගම් සිතියමේ ලොට් 25 කොටසක්) ප. 21.21ක ප්‍රමාණයක්.

උතුරට සහ බස්නාහිරට: බිසෝදොල; නැගෙනහිරට: එම ඉඩමේ ඉතුරු කොටස; දකුණට: දොඩන්ගහයටලියද්ද නමැති ඉඩම.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමති.

1960ක්වූ මාර්තු මස 28 වැනි දින,
කොළඹදීය.

---

ඇල්එච්/ඩී/1/58.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරලයේ මහපත්තු දකුණේ, ඉඟුරුදළුව නම් ගමේ පිහිටි අන්තිම ගම් සැලැසුම නො. 1 ඉන්සෙට් 27, අතිරේක නො. 1, කැබලි නො. 1,265 සහ 1,266.

**කැබැලි නො. 1265.**

ඉඩමේ නම: හල්ගස්වත්ත; විස්තර: අවු. 3-7 දක්වා වයසැති රබර් ගස් 40; අයිතිකරුවෝ—වැවිල්ලට හිමිකම් කියන්නෝ: ඩබ්ලිව්. ඩී. ජූලියන් සිංඤෝ, ඩබලිව්. ඩී. රබෙල් සිංඤෝ, ඩබ්ලිව්. ජූලියන් සිංඤෝ, ඩබ්ලිව්. සරනේලිස්, ඩබ්ලිව්. සුදේරිස්, ඩබ්ලිව්. බෙම්පි, ඩබ්ලිව්. බාරොන්, ඩබ්ලිව්. ප්‍රේමවතී, ගරු අතලේ දේවරක්කිතහිමි, ඩබ්ලිව්. ජූසිලින් නෝනා, හින්නිනෝනා විරසිංහ, ඇස්. ඒ. ඩී. මතෙස් මහිපාල, ඩබ්ලිව්. ඩී. මාටින්, එච්. බාරොන් අප්පුහාමි, එච්. මර්තේනිස් අප්පුහාමි, එච්. සයිමන් අප්පුහාමි, එච්. ඒබ්‍රහම් අප්පුහාමි, එච්. බේබිනෝනා, එච්. කුරේනිස් අප්පුහාමි, එච්. ලුවිස් අප්පුහාමි, එච්. හෙන්ද්‍රික් අප්පුහාමි, එච්. සිසිලින් නෝනා, එච්. පොඩිනෝනා, කේ. හැන්ඩි අප්පුහාමි, කේ. පීටර් අප්පුහාමි, කේ. සයිමන් අප්පුහාමි, කේ. චන්ද්‍රදාස අප්පුහාමි, කේ. මේරිනෝනා සහ කේ. මිසිනෝනා; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 07.3.

**කැබලි නො. 1266.**

ඉඩමේ නම: හල්ගස්වත්ත; විස්තර: අවු. 5-10ක රබර් ගස් 85, අවු. 4-8 පොල් ගස් 18, අවු. 15-25ක කොස් ගස් 8, අවු. 5-7 පුවක් ගස් 27, අවු. 5-10 තේ පඳුරු 45; අයිතිකරුවෝ—වැවිල්ලට හිමිකම් කියන්නෝ: ඩබ්ලිව්. ඩී. රබෙල් සිංඤෝ, ඩබ්ලිව්. ජූලියන් සිංඤෝ, ඩබ්ලිව්. ඩී. රබෙල් සිංඤෝ, ඩබ්ලිව්. සරනේලිස්, ඩබ්ලිව්. සුදේරිස්, ඩබ්ලිව්. බෙම්පි, ඩබ්ලිව්. බාරොන්, ඩබ්ලිව්. ප්‍රේමවතී, ගරු අතලේ දේවරක්කිතහිමි, ඩබ්ලිව්. ජූසිලින් නෝනා, හින්නිනෝනා වීරසිංහ, ඇස්. ඒ. ඩී. මතෙස් මහිපාල, ඩබ්ලිව්. ඩී. මාටින් අප්පුහාමි, එච්. බාරොන් අප්පුහාමි, එච්. මරතේනිස් අප්පුහාමි, එච්. සයිමන් අප්පුහාමි, එච්. ඒබ්‍රහම් අප්පුහාමි, එච්. බේබිනෝනා, එච්. කුරේනිස් අප්පුහාමි, එච්. ලුවිස් අප්පුහාමි, එච්. හෙන්ද්‍රික් අප්පුහාමි, එච්. සිසිලින් නෝනා, එච්. පොඩිනෝනා, කේ. හැන්ඩි අප්පුහාමි, කේ. පීටර් අප්පුහාමි, කේ. සයිමන් අප්පුහාමි, කේ. චන්ද්‍රදාස අප්පුහාමි, කේ. මේරිනෝනා සහ කේ. මිසිනෝනා; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 36.4.

මුළු ගණන: අ. 0, රූ. 3, ප. 03.7.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අගෝස්තු මස 4 වැනි දින පූ.භා. 10.30ට අගලවත්තේ ආදායම් පාලක කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 ජූලි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1960ක්වූ අප්‍රේල් මස 26 වැනි දින,
කළුතර කච්චේරිය.

---

සඳහන් අංකය: ජේ. 55 එච්ඒ 151/ඇල්බී. 2257.

## 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට යෙදුන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට යෙදුන ඉඩමේ විස්තර:—— මූලික සැලැස්ම අංක: ඒ. 1,766.

පහත සඳහන් ඉඩම් පිහිටා ඇත්තේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදායම් නිලධාරි කොටසේ දික්වැල්ල දකුණේය.

**කැබලි අංකය 1.**

ඉඩමේ නම: බේරුවල විල; ඉඩමේ විස්තර: කුඹුර; අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන්: ඩී. කේ. ඇස්. මුතුකුමාරණ, කෝන්දෙනිය, දික්වැල්ල; බිම් ප්‍රමාණය: අ. 0, රූ. 2, ප. 37.3.

**කැබලි අංකය 2.**

ඉඩමේ නම: බේරුවල විල; ඉඩමේ විස්තර: කුඹුර; අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන්: පී. එච්. මුතුකුමාරණ, පී. සී. මුතුකුමාරණ නෝනාමහත්මිය සහ ඩී. ඩී. ඒ. සමරජීව නෝනාමහත්මිය, බෝදිගොඩවත්ත, වැවුරුකන්නල, දික්වැල්ල; බිම් ප්‍රමාණය: අ. 0, රූ. 2, ප. 18.9.

එකතුව: අ. 1, රූ. 1, ප. 16.2.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩම් සම්බන්ධතාවන් ඇති සියලු දෙනා● ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයක් 1960 ජූනි මස 14 දින උදේ 9.30 ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960 ජූනි මස 6 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනීසිටීමට ලියවිල්ලකින් බලයලත් නියෝජිතයන් හෝ මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තම තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනික් ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

එච්. ආර්. අමිත්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය,
1960 අප්‍රේල් මස 26 දය.

**කැබැල්ල අංකය : 223.**

ඉඩමේ නම : ගල්තුන්ඇල්ලේ කුඹුර ; විස්තර : කුඹුර ; අයිතිවාසිකම් කියන අයගේ නම : ඩබ්ලිව්. ඇම්. රම්බන්ඩා, කනදෙනියවල, පිහිඹුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 24.7.

**කැබැල්ල අංකය : 224.**

ඉඩමේ නම : ගල්තුන්ඇල්ල නොහොත් පොල්ගහමුලලියද්ද, විස්තර : කුඹුර ; අයිතිවාසිකම් කියන අයගේ නම : ඩබ්ලිව්. ඇම්. බණ්ඩාර මැණිකා, දොඹගොල්ල, පිහිඹුව ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.

**කැබැල්ල අංකය : 225.**

ඉඩමේ නම : ගල්තුන්ඇල්ල නොහොත් පොල්ගහමුලලියද්ද ; විස්තර : අවුරුදු 20ක් වයසැති පොල් ගස් 1ක්, සහ අවුරුදු 1ක් වයසැති පොල් පැල 2ක් ඇති කුඹුර ; අයිතිවාසිකම් කියන අයගේ නම : ඇල්. එච්. සමරා, මීලියද්ද, පිහිඹුව; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 02.7.

අත්කර ගැනීමට අදහස්කරණ ඉහතකී ඉඩම්වලට සම්බන්ධතාවක් ඇති සියලුදෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලයලත් නියෝජිතයින් මෙහි පහත සඳහන් දිනදී සහ වේලාවල් වලදී මීලියද්ද විහාරස්ථානයේ ධර්මශාලාවේදී මා ඉදිරියේ පෙනී සිටිය යුතු යි.

තවද පහත සඳහන් දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් අත්කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**කැබැල්ල අංකය : 13, 14, 15, 16, 17, 18 සහ 19.**

මූලික සැ. අංකය : 825 ; විභාගය පවත්වන දිනය : 10.6.60 ; විභාගය පවත්වන වේලාව : පෙරවරු 11ට ; වන්දි මුදල් සම්බන්ධ ලියා එවිය යුතු අන්තිම දිනය : 3.6.60.

**කැබැල්ල අංකය : 204, 204½, 205, 206, 207, 208, 209 සහ 210.**

මූලික සැ. අංකය : 823 ; විභාගය පවත්වන දිනය : 10.6.60 ; විභාගය පවත්වන වේලාව : පෙරවරු 11ට ; වන්දි මුදල් සම්බන්ධ ලියා එවිය යුතු අන්තිම දිනය : 3.6.60.

**කැබැල්ල අංකය : 211, 212, 219, 220, 221, 222, 223, 224 සහ 225.**

මූලික සැ. අංකය : 823 ; විභාගය පවත්වන දිනය : 10.6.60 ; විභාගය පවත්වන වේලාව : දවල් 12ට ; වන්දි මුදල් සම්බන්ධ ලියා එවිය යුතු අන්තිම දිනය : 3.6.60.

එම්. එල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ උප ඒජන්ත තැන.

1960ක්වූ අප්‍රේල් මස 30 වෙනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

---

අංකය : ඇල්.ආර්/1584.

**1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත**

**7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වමි.

ලබාගැනීමට අදහස් කරන ලද ඉඩම්වල විස්තර :—

අංක 1,304 දරණ අවසාන ගම් පිඹුරේ, අංක 1 දරණ අතිරේකය
ඉහළ කන්සිදිගම

**ලොට් අංක 90.**

ඉඩමේ නම : අක්කර වත්ත ; විස්තරය : වතු ඉඩම සහ කුඹුරු ඉඩම, අවු. 20ක් පමණ වූ හල්මිල්ල ගස් දෙකක් සහිතව ; හිමිකම් කියන්නා : කපුරාල ගමරාලගේ පුංචිරාල, මරදන්කඩවල-හොරොවුපොතාන ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 12.2.

**ලොට් අංක 91.**

ඉඩමේ නම : අක්කර වත්ත ; විස්තරය : කුඹුරු ඉඩම, වතු ඉඩම සහිතව, අවු. 25–30 පොල් ගස් 11යි, අවු. 5 පමණ වූ අඹ ගස් 1යි, අවු. 20ක් පමණ වූ හල්මිල්ල ගස් 9යි සහ තාවකාලික නිවාසයක් ; හිමිකම් කියන්නා : දීසානායක මුදියන්සෙලාගේ පුංචිරාල වෙද මහත්මා, කහටගස්දිගිලිය ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 21.6.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 ජූනි මස 17 වෙනි දින පෙරවරු 9ට කහටගස්දිගිලියේ, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේදී මා හමුවිය යුතුයි.

තවද 1960 ජූනි මස 10 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත්මූ දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සී. ඩබ්ලිව්. ඇම්. අපෝන්සු,
අනුරාධපුර දිසාපති වෙනුවට.

1960 අප්‍රේල් මස 22 වන දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේදීය.

---

සැඳහුම් අංකය : ඇල්. ආර්. 1684.

**1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**7 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කරන බැව් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ලබා ගැනීමට අදහස් කර ඇති ඉඩම්වල විස්තර:—

අවසාන ගම් සිතියම් අංක 971, අතිරේක අංක 1—අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාගම් පළාතේ නැගම්පහ කෝරලේ ඉහළ කලංකුට්ටිය යැයි කියනු ලබන ගම.

**ලොට් අංකය: 88**

ඉඩමේ නම: ඇලබොඩ අක්කරේ; විස්තර: කුඹුරු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: උක්කු බණ්ඩාගේ මැක්අම්ම, උක්කු බණ්ඩාගේ කිරි එතනා, උක්කු බණ්ඩාගේ මැන්සොහාමි, පින්හාමිගේ අප්පුහාමි සහ උක්කුරාලගේ කපුරු බණ්ඩා, සියළු දෙනාම ඉහළ කලංකුට්ටිය, බණ්ඩාගේ හේරත්හාමි, කටුගම්පොල ; ප්‍රමාණය : අක්. 0, රූඩ්. 1, පර්. 22.9.

**ලොට් අංකය : 89**

ඉඩමේ නම: ඇලබොඩ අක්කරේ; විස්තර: කුඹුරු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: බණ්ඩාගේ හේරත්හාමි, කටුගම්පොල; ප්‍රමාණය: අක්. 0, රූඩ්. 1, පර්. 39.7.

**ලොට් අංකය : 90**

ඉඩමේ නම: ඇලබොඩ අක්කරේ; විස්තර: කුඹුරු ඉඩම; හිමිකම් කියන්නාගේ නම : උක්කුරාලගේ කපුරු බණ්ඩා, ඉහළ කලංකුට්ටිය ; ප්‍රමාණය : අක්. 0, රූඩ් 1, පර්. 22.3.

**ලොට් අංකය : 91**

ඉඩමේ නම: ඇලබොඩ අක්කරේ; විස්තර: කුඹුරු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: රන්හාමිගේ අප්පුහාමි, ඉහළ කලංකුට්ටිය; ප්‍රමාණය: අක්. 0, රූඩ්. 0, පර්. 36.8.

**ලොට් අංකය : 92**

ඉඩමේ නම: ඇලබොඩ අක්කරේ; විස්තර: කුඹුරු ඉඩම; හිමිකම් කියන්නාගේ නම : කිරිහාමිගේ උක්කු අම්මා, ඉහළ කලංකුට්ටිය : ප්‍රමාණය: අක්. 0, රූඩ්. 0, පර්. 16.2.

**ලොට් අංකය : 93**

ඉඩමේ නම: ඇලබොඩ අක්කරේ; විස්තර: කුඹුරු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: උක්කු බණ්ඩාගේ මැක්අම්මා, උක්කුබණ්ඩාගේ කිරි එතනා, සහ උක්කු බණ්ඩගේ මිනෝහාමි, ඉහළ කලංකුට්ටිය ; ප්‍රමාණය: අක්. 0, රූඩ්. 0, පර්. 00.7.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලිපිවලින් බලය ලත් අයවළුන් හෝ 1960 ජූනි මස 25 වෙනි දින පෙරවරු 10යට අ/පහළ කලංකුට්ටිය රජයේ පාසැලේදී මා හමුවිය යුතුයි.

තවද 1960 ජූනි මස 18 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. ඇල්. ගුණසේකර,
අනුරාධපුර දිසාපති වෙනුවට.

1960 අප්‍රේල් මස 26 වන දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේ දී ය.

## වරද ශුද්ධ කිරීම

යොමු අංකය ජේ 57/58 ඇල් 471 (වීඊ) ඇල් බී/ඇල් ඊ/107

ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින් 1954 රේ අංක 39 දරණ (සංශෝධිත) ඉඩම් රජයට අත්පත් කිරීමේ ආඥාපනතින් සංශෝධනය කරන ලද 1950 හේ අංක 9 දරණ ඉඩම් රජයට අත්පත් කරගැනීමේ ආඥාපනතේ 5 වෙනි වගන්තියේ පලවෙනි උප වගන්තිය යටතේ 1959. 2. 23 වෙනි දින නිකුත් කොට අංක 11,718 සහ 1959. 4. 3 දාතම දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශයට පහත සඳහන් ශුද්ධීන් කරනු ලැබේ.

(ඒ) පිහිටීම ගැන කරන විස්තරයේ 3 වෙනි පේලියේ "පනන් ගම්මන" යන වචනය අස්කොට "හෙල්බොඩ" යන වචනය ඇතුළත් කිරීම සහ 4 වෙනි පේලියේ "පනන්ගම්මන" යන වචනය අස්කොට "රම්බොඩ වවුව අංක 474" යන වචනය හා ඉලක්කම් ඇතුළත් කිරීම.

(බී) මායිම් ගැන කරන විස්තරයේ පලවෙනි පේලියේ "උතුරෙන්" යන වචන වලට පසුව "පාර සහ" යන වචන ඇතුළත් කිරීම සහ දෙවෙනි හා තුන්වෙනි පේලිවල "නොහොත් ගත්කෝවෙල කොලනිය" යන වචන අස්කිරීම.

## වරද ශුද්ධියයි

යොමු අංක: ජේ. 57/58 එල් 471 (වීඊ)—ඇල් බී/ඇල් ඊ/107.

ගරු කෘෂිකර්ම හා ඉඩම් ඇමති තුමා විසින් 1954රේ අංක 39 දරණ (සංශෝධිත) ඉඩම් රජයට අත්පත් කිරීමේ ආඥාපනතේ සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් රජයට අත්පත් කර ගැනීමේ ආඥාපනතේ අංක 5 දරණ වගන්තියේ පළවෙනි උප වගන්තිය යටතේ 1959.10.9 වෙනි දින නිකුත් කොට අංක 11,959 සහ 1959.11.20 දාතම දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ ප්‍රකාශයේ සඳහන් ඉඩම ගැන කරන විස්තරයේ පහත සඳහන් ශුද්ධීන් කරනු ලැබේ:—

(ඒ) විස්තරයේ දෙවෙනි පේලියේ "ඕතලාව" යන වචනය අස්කොට "අඹතලාව උඩගම්මැද්ද" යන වචනය ඇතුළත් කිරීම.

(බී) මායිම් ගැන කරන විස්තරයේ පස්වෙනි පේලියේ "මැද්දේ තැන්න වත්ත නැමැති ඉඩම" යන වචන අස්කොට "කොස්වානේ ඇල" යන වචන ඇතුළත් කිරීම.

## නිවැරදිකිරීමයි

අංක: ජේ. 57 ඇල් ජී 277/ඇල්. බී. 2325.

1958 වේ අප්‍රේල් මස 25 වැනි දින අංක 11,302 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ, ගරු ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින්, වර්‍ෂ 1954රේ අංක 39 දරණ ඉඩම් රජයට පවරා ගැනීමේ සංශොධන පනතින් සංශොධිත වර්‍ෂ 1950හේ අංක 9 දරණ ඉඩම් රජයට පවරා ගැනීමේ පනතේ 5 වැනි වගන්තිය යටතේ 58.4.2 වැනි දින කරන ලද ප්‍රකාශනය පහත සඳහන් අයුරු නිවැරදි විය යුතුය.

(අ) 4 වැනි පේළියේ "අවසාන ගම්සිතියම් අංක 166යේ කැබලි අංක 25 ඇම් 1" යන වචන අස්කර ඒ වෙනුවට "අවසාන ගම් සිතියමේ කැබලි අංක 25 ඇම් 1 සහ 25 ඇන්1" යන්න යෙදිය යුතුය.

(ආ) 8 වැනි පේළියේ "එම ඉඩමේ ඉතිරි කැබැල්ල සහ පල්ලාවල පිටවලගම ගම්සහාපාර" යන වචන අස්කර ඒ වෙනුවට "ඉත්තගලහේන (අවසාන ගම් සිතියම් අංක 166යේ කැබලි අංක 64)" යන්න යෙදිය යුතුය.

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඇල්. 6929.

## 1948 ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ රෙගුලාසි මාලාවේ 21 (2) වැනි රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කොළඹ වාණිජ සේවා ක්‍රිකට් සමාජයේ භාරකරුවන් වන එස්. ටී. එල්. ද සොයිසා, ආර්. පී. සේනානායක හා ජී. බී. එස්. ගෝමස් යන මහත්වරුන් විසින් ක්‍රීඩා හා විනෝද කටයුතු සඳහා කොළඹ නගර සභා සීමාවතුල පිහිටි, අක්කර 4 රූ. 3 පර්. 38.15 ක බිම් ප්‍රමාණයක් ඇති අංක: ඒ. 3029 දරණ මුල් පිඹුරේ බිම් කැබලි අංක 1 දරණ ඉඩම බද්දට දෙනලෙස ඉල්වා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ආණ්ඩුවේ කොන්දේසි වලට යටත්කොට මෙම ඉඩම එම සමිතියට බදුදීමට අදහස් කර තිබේ. එම කොන්දේසි වලින් සමහරක් මෙසේ ය.

(අ) කාලය:— අවුරුදු 99 යි.

(ආ) බදු මුදල:—වර්‍ෂයකට රුපියල් 750යි.

(ඉ) බදුකාරයන් විසින් මෙම ඉඩම ක්‍රිකට් පිටියක් සඳහාත් වෙනත් විනෝද ක්‍රීඩා සඳහාත් ඇර අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඊ) කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැනගෙන් කලින් ලබාගත් බලයක් නොමැතිව බදුකාරයන් විසින් මෙම ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිනොකළ යුතුය.

(උ) බද්ද පටන්ගත් දින සිට අවුරුදු දෙකක් ඇතුලත කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන සෑහීමකට පත් කිරීමට තරම් හොඳින් බදුකාරයන් විසින් මෙම ඉඩමෙහි ක්‍රීඩා මණ්ඩපයක් තැනවිය යුතුය.

(ඌ) දෙපක්ෂයේ කිනම් පාර්ශවයකින් හෝ දෙනු ලබන හය මාසයක දැනුම් දීමකින් පසුව මෙම බද්ද අවසන් කළ හැකිවේ.

3. මෙහි සඳහන් වන දිනයේ සිට සති හයකින් පෙර, වැදගත් කරුණු ඇතිව ඉඩම් කොමසාරිස් තැන වෙත ලියවිල්ලකින් විරෝදය පළ නොකළහොත් මෙම බද්ද දෙනු ලැබේ.

1960 මැයි මස 6 වෙනි දින,<br>කොළඹ දීය.

එච්. සී. ගුනවර්ධන,<br>ඉඩම් කොමසාරිස්.

අංකය: ඇල්. ඇස්. 4532.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

වව්නියා දිස්ත්‍රික්කයේ මරකාරම්පල්ලේහි පිහිටි අක්කර 2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, පාඨශාලාවක් පිහිටුවීම සඳහා මරකාරම්පල්ලේ ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන මරකාරම්පල්ලේහි පදිංචි ඇස්. සේනාතිරාජා සහ ඇස්. තමෝතරම් පිල්ලේ යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

ඉඩමේ මායිම් මෙසේය:—

උතුරට: ආණ්ඩුවේ ඉඩම; දකුණට: ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට: ගම්සභා පටු මග; බටහිරට: සේනාතිරාජා මහතාගේ ඉඩම;

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) කාලය: අවුරුදු 5 යි.

(ඉ) බද්ද: අවුරුද්දකට රු. 1 සත 50 යි.

(උ) බදුගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 2 ක් ඇතුළතදී වව්නියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි පාඨශාලාවක් තනා නිමකළ යුතුය.

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම පාඨශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

1960 මැයි මස 6 වැනි දින,<br>කොළඹ දීය.

වී. රාමනාදන්,<br>ඉඩම් කොමසාරිස් වෙනුවට.

අංකය: ඇල් ඇස්. 4530.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

බදුලු දිස්ත්‍රික්කයේ උඩුකිඳ කොට්ඨාශයේ, උඩපළාත කෝරළේ, අඹේවෙල පිහිටි 513 ගම් පිඹුරයේ 272 වැනි බිම් කැබැල්ලෙන් අක්. 1/4ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, රැස්වීම් ශාලාවක් ඉදි කිරීම සඳහා අඹේවෙල ග්‍රාම සංවර්ධන සමිතියේ භාර කරුවන් වන හේරත් මුදියන්සේලාගේ අප්පුහාමිගමරාළ, නවරත්න මුදියන්සේලාගේ පුංචිබණ්ඩා සහ හේරත් මුදියන්සේලාගේ සුදු බණ්ඩා යන මහතුන් විසින් බදු ඉල්ලා ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

2. අවශ්‍ය කාරණය සඳහා ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:—

(අ) කාලය: අවුරුදු 5යි.

(ඉ) බද්ද: අවුරුද්දකට ශත 50යි.

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භ වූ දින සිට මාස 6 ක් ඇතුලත දී බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිද්දෙන් එකී ඉඩමෙහි රැස්වීම් ශාලාවක් තනා නිම කළ යුතුය.

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම රැස්වීම් ශාලාවක් තැනීම පිණිස මිස අන්‍ය කටයුත්තක් සඳහා නොයෙද විය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැණෙන හේතු ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම් අනුව බද්ද දෙනු ලැබේ.

1960 මැයි මස 6 වැනි දින,<br>කොළඹදීය.

වී. රාමනාදන්,<br>ඉඩම් කොමසාරිස් වෙනුවට.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. **දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේ යි :—**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට .. | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. **පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.